
# දිනුක දන්න කතාවක්



මද්‍යසාර සහ
මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ
**ප්‍රකාශනයක්**

ADIC
Alcohol and Drug Information Centre

## දරුවන්ගේ හෙට ලොව දිනන්නට
## ආදරණීය ලෙස අත දෙන්නා වූ
## පෙර පාසල් ගුරු මෑණිවරුන් උදෙසා............

දරුවන් කුඩා කල සිට මද්‍යසාර, දුම්වැටි වලට හුරු කිරීම උදෙසා ක්‍රියා කරන විම සමාගම් වල උපක්‍රම වලට දරුවන් තුල ප්‍රතිශක්තිකරණය ඇති කිරීමේ අරමුණෙන්, පෙර පාසල් ගුරුවරුන්ට මෙම කතාන්තර දරුවන්ට කියා දිය හැකි ආකාරයට මෙම පොත නිර්මාණය කර ඇත.

දරුවන්ට කියා දිය හැකි මෙම කතාන්තරය තුළ දරුවන් කැමැත්තෙන් සිටින්නේ සෙල්ලම් කරන්න බවත්, රූපවාහිනිය බැලීමට සිදු වන්නේ තුවාලයක් නිසා සෙල්ලම් කරන්න නොහැකි වීම හේතුවෙන් යන අදහස ලබාදීමට මෙම කතාව තුළින් උත්සාහ කර ඇත.

රූපවාහිනී නරඹන අවස්ථාවන්වල දී දරුවන්ට ගැටලුවක් ඇති වුවහොත් වැඩිහිටියන්ගෙන් විමසීමට හැකි බව පෙන්වා දීම කළ යුතු දෙයකි .

සිගරට් බිව්වාම මූණ කැතවෙනවා, ලස්සන නැතිවෙනවා කියලා දන්නවා නම් කවුරුවත් සිගරට් බොන්න පටන් ගන්නේ නැ. ඒහෙම වෙනවා කියලා නොදන්නා නිසා තමා මේ මිනිස්සු සිගරට් බොන්නේ කියලා දරුවන්ගේ මනස තුළට ඇතුල් කිරීමට මෙයින් අවස්ථාව ලබා දී ඇත.

සිගරට් බිව්වාම මූණ කැතවෙන දෙයක් කාටූන් වලින් පෙන්නලා ළමුන් රවට්ටනවා කියලා දරුවන්ගේ සිත් තුළට ගිය පසු රූපවාහිනියෙන් සිගරට් බොන දර්ශන පෙන්වීමේ දී එය දකින දරුවාට “අන්න අපිව රවටන දෙයක් කියලා” මතක් කරවීමට මෙහිදී උත්සාහයක් ගෙන ඇත. මෙය වඩාත් පහසුවෙන් දරුවාගේ මතකයේ රැඳවීම සඳහා කවි නිර්මාණයක් ද යොදාගෙන ඇත.

---

ඔබගේ අදහස් අපට වැදගත්

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org

**චිත්‍ර නිර්මාණය** -
තේජා දෙහිවත්ත

**පිටු සැකසුම** -
හර්ෂණා නිමලසූරිය

**සංකල්පය** -
මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)

දිනූකගේ කකුලේ පුංචි තුවාලයක්, සිඟිතිත් ඇවිල්ලා.

"ඒත් අද සෙල්ලම් කරන්න විදිහක් නෑ" දිනූක දුකෙන් වගේ කිව්වා.



දුකෙන් ඉන්න දිනුක දිහා බලලා
"අපි කාටූන් බලමු කියලා"
සිඟිති කිව්වා.

සිඟිති කිව්ව නිසා දිනුක ටීවී එක
දැම්මා.

"ආ...කාටූන් එක පටන්ගෙන"
සිඟිති කිව්වා.



“හාපැංචා පස්සෙන් අර දුවන්නෙ
නරිහාමි නේද?”

දිනූක කිව්වා.

නරිහාමි නැවතිලා

“ආ.... නරිහාමි සිගරට් එකක්
බොනවා නේද...”


සිඟිති දිනූකගෙන් ඇහුවා.

“කාටූන්වල සිගරට් බොනවා
පෙන්නන්නෙ ඇයි ?”

දිනූක සිඟිතිගෙන් ප්‍රශ්නයක් ඇහුවා.

“ඇත්තටම කාටූන් වල සිගරට්
බොනවා පෙන්නන්නේ ඇයි”

සිඟිති කල්පනා කරමින් වටපිට
බැලුවා.



දිනූකගෙ අම්මා පොතක් බලමින් ඉන්නවා සිඟිති දැක්කා.

"නැන්දෙ අපි ආසාවෙන් බලන කාටූන්වල සිගරට් බොනවා පෙන්නන්නෙ ඇයි ? "

සිඟිති දිනූකගෙ අම්මාගෙන් ඇහුවා.



"කාටූන්වල සිගරට් බොනවා
පෙන්නන්නේ පුංචි ඔයාලාව
රවට්ටන්න"

දිනූකගෙ අම්මා කිව්වා.

"ඇයි නැන්දෙ එහෙම කරන්නෙ"
සිඟිති දුකෙන් ඇහුවා.

**"සිගරට් බිව්වාම මූණ කැතම කැත
වෙනවා,**

**ලස්සන නැති වෙනවා**

**ඉතින් ඒක දන්නවා නම් කවුරුවත්
සිගරට් බොන්නෙ නෑ"**



දිනූකගෙ අම්මා කිව්වා.

"ඉතින් ඉතින් නැන්දෙ"
ඉවසිල්ලක් නැතිව සිඟිති ඇහුවා.

"ඉතින් කාටූන්වල සිගරට් බොනවා පෙන්නලා, සිගරට් ගැන බොරු කියලා දීලා පුංචි ඔයාලාව රවට්ටන්න තමා එහෙම කරන්නෙ"

දිනූකගෙ අම්මා කිව්වා.

"කාටූන් වල සිගරට් බොනවා පෙන්නන්නේ ඇයි කියලා මම දැන් දන්නවා" සිඟිති කිව්වා.



"හා එහෙනම් කියන්න බලන්න"
දිනූක සිඟිතිට කිව්වා.

"සිගරට් ගැන බොරු උගන්නලා
ළමයි රවට්ටන්න තමා කාටූන්වල
සිගරට් බොනවා පෙන්නන්නෙ"

සිඟිති කිව්වා.

"සිඟිතිත් දැන් දන්නවා නේද අපි
ආසාවෙන් බලන කාටූන්වල සිගරට්
බොනවා පෙන්නන්නෙ ඇයි කියලා"

දිනූක කිව්වා.

"මම සිඟිතිට කවියක් කියලා
දෙන්නම්"


දිනූක කවිය කියන්න පටන් ගත්තා.



"සිගරට් ගැන බොරු කියන්න
කාටූන්වල සිගරට් බොනවා
පුංචි ළමයි රවට්ටන්න
කාටූන්වල සිගරට් බොනවා "

"ආ ... මම මේ කවිය පාඩම්
කරගෙන හෙට ඇවිත් කියන්නම්"

සිඟිති එසේ කියමින් ගෙදර යන්න
පිටත්වුණා.



අපේ තාත්තා
අරක්කු බොන්නේ නැත්තේ
මට ආදරේ හින්දයි



එයාටත්
සතුටින් ඉන්න
ඕන නිසයි


ADIC
Alcohol and Drug Information Centre

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org